## පළමුවන දේව ප්‍රකාශනය

ලෙවී කථාව 13:1-3, 44-46

ලෙවී ව්‍යවස්ථාවෙන් උපුටා ගත් කොටසකි.

**(කුෂ්ඨ රෝගියා කඳවුරෙන් පිට වී හුදෙකලාව විසිය යුතු ය.)**

තවද, සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක. "යමෙකුගේ ශරීරයේ හමේ බිබිලක් හෝ තඩිස්සියක් හෝ පැල්ලමක් හෝ හටගෙන, එය බෝවෙන චර්ම රෝගයක් වන්නට ඉඩ තිබේ නම්, ඔහු පූජක ආරොන් වෙත හෝ පූජකයෙකු වන ඔහුගේ පුතෙකු වෙත හෝ ගෙනා යුතු ය. පූජකවරයා ද ඔහුගේ ශරීරයේ හමේ කුෂ්ඨය සෝදිසි කළ යුතු ය. රෝගය ඇති ස්ථානයේ රෝම සුදු පාට වී, කුෂ්ඨය හමේ ගැඹුරට ගොස් තිබේ නම්, එය බෝවෙන චර්ම රෝගයක් වේ. පූජකවරයා ද ඔහු සෝදිසි කළ පසු ඔහු අපවිත්‍ර ය කියා ප්‍රකාශ කළ යුතු ය. ඔහු හමේ බෝවෙන රෝගයක් ඇති කෙනෙකි. ඔහු අපවිත්‍ර ය. පූජකවරයා ඒ තැනැත්තාගේ හිසේ බෝවෙන චර්ම රෝගයක් ඇති බැවින් ඔහු අපවිත්‍ර යයි ප්‍රකාශ කළ යුතු ය. බෝවෙන චර්ම රෝගියා ද තම වස්ත්‍රය ඉරාගෙන, තම හිසකෙස් අවුල් කොටගෙන, තම උඩු තොල රෙදි පටියකින් වසාගෙන, 'අපවිත්‍ර ය, අපවිත්‍ර ය'යි කෑගැසිය යුතු ය. බෝවෙන චර්ම රෝගය ඇති මුළු කාලය තුළ ම ඔහු කෙලෙසුණු, අපවිත්‍ර කෙනෙකි. ඔහු කඳවුරෙන් පිටත හුදකලා ව විසිය යුතු ය."

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 32:1,2,5,11

ඔබගේ පිළිතුර: සමිඳුනි, මා රැකවරණය ඔබ වහන්සේ ම ය.

ගීය: අපරාධයට සමාව ද පාපයට සමාව ද ලත් මිනිසා ආසිරි ලද්දෙකි. වරදක් ගැන සමිඳුන්ගෙන් චෝදනාවක් නොලබන, වංක සිතක් නොමැති මිනිසා ආසිරි ලද්දෙකි.

මාගේ පව් නොසඟවා මම පාපොච්චාරණය කළෙමි. 'හිමි තුමන්ට මාගේ පව් කියන්නෙමි' යි කීමි. ඔබ ද මාගේ පාප දෝෂ කමා කළ සේක.

දැමිටුනි, හිමි තුමන් කෙරේ ප්‍රීති වී උදන් අනන්න. අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති සෝෂා පවත්වන්න.

## දෙවන දේව ප්‍රකාශනය

1කොරින්ති 10:31-11:1

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**("මා ක්‍රිස්තුස් වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබ ද මා ආදර්ශයට ගන්න.")**

එහෙයින් ඔබ කෑවත් බීවත් වෙන දෙයක් කළත් සියල්ල දේව ගෞරවය පිණිස කරන්න. ජුදෙව්වරුන්ට වත්, ග්‍රීකයන්ට වත්, දෙවියන් වහන්සේගේ සභාවට වත් බාධාවට හේතුවක් නොවන්න. මම නම් මාගේ ම ප්‍රයෝජනය නොසොයා බොහෝ දෙනෙකුගේ ගැළවීම පිණිස ඔවුන්ගේ ප්‍රයෝජනය සොයා, සියල්ලෙහි දී සියල්ලන් සතුටු කරමි. මා ක්‍රිස්තුස් වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබ ද මා ආදර්ශයට ගන්න.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## **සුසුවත් ජය නද** ජොහන් 6:51

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක ආහාරය මම ය. යමෙක් මේ ආහාරයෙන් වැළඳුවොත්, ඔහු සදහට ම ජීවත් වන්නේ ය. මා විසින් දෙනු ලබන ඒ ආහාරය මාගේ මාංසය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය පිණිස ය"යි වදාළ සේක. ආලේලූයා!

## **ශුද්ධවූ සුවිශේෂය** මාක් 1:40-45

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(එකෙණෙහි ම ලාදුරු රෝගය සුව වී ඔහු පවිත්‍ර කරනු ලැබුවේ ය.)**

එකල, ලාදුරු රෝගියෙක් ජේසුස් වහන්සේ වෙත අවුත් දණින් වැටී, "ඔබ කැමැති සේක් නම්, මා පවිත්‍ර කරන්න ඔබට හැකි ය"යි අයැද සිටියේ ය. උන් වහන්සේ මහානුකම්පාවෙන් අත දිගු කොට ඔහු පිට තබා, "මම කැමැත්තෙමි, පවිත්‍ර වන්නැ"යි වදාළ සේක. එකෙණෙහි ම ලාදුරු රෝගය පහ වී ඔහු පවිත්‍ර කරනු ලැබී ය. උන් වහන්සේ, "මේ ගැන කිසිවෙකුට කිසිවක් නොකියන ලෙස බලාගන්නැ"යි ඔහුට තදින් අණ දී, "යන්න, පූජකයා ඉදිරියෙහි පෙනී සිටින්න; මෝසෙස්ගේ නියමය පරිදි පවිත්‍රවීමේ සහතිකයක් ලෙස පූජා ඔප්පු කරන්න" කියා ඔහු වහා පිටත් කර යැවූ සේක. එහෙත්, ඔහු ගොස් ඒ මුළු සිද්ධිය ප්‍රසිද්ධ ලෙස කිය කියා, දස දෙස පතුරුවා හැරියේ ය. එහෙයින්, කිසි නුවරකට ප්‍රසිද්ධියේ පිවිසෙන්නට ඉන්පසු උන් වහන්සේට නොහැකි වූයෙන්, ජේසුස් වහන්සේ පාළු පෙදෙස්වල නැවතුණ සේක. එසේ වුව ද, සමූහයා සියලු දිශා භාගවලින් උන් වහන්සේ වෙත පැමිණියහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.